## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කම්කරු/මුරකරු තනතුරුවලට බඳවා ගැනීම - 2026.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පවතින කම්කරු/මුරකරු තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01.**සුදුසුකම්** :

**i.**අධ්‍යාපන **සුදුසුකම් :** අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන දෙක (02) ක් සහිතව විෂයන් හය (06) ක් සමත්ව තිබීම.

**ii.**වෙනත් **සුදුසුකම්** :

- යහපත් චරිතයකින් යුක්ත අයවලුන් විය යුතු අතර චරිත දූෂණයට අදාල වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

**iii.** වයස **:** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට එනම්, 2026.04.20 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

02.වැටුප් ක්‍රමය **:** අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව,කම්කරු/මුරකරු තනතුරුවලට අදාළ මාසික වැටුප් පරිමාණය PL-2025 රු.40,000 -10x450-10x490-10x540-12x590-61,880/- වේ.

03.බඳවා ගන්නා ආකාරය **:** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

04.බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය.

05.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

| නිර්ණායකය | ලකුණු ප්‍රමාණය |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 25 |
| කාර්මික හා වෘත්තිය කුසලතා | 35 |
| ක්‍රීඩා | 15 |
| චරිත වර්ධනය හා නායකත්වය | 15 |
| සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීම. | 10 |
| එකතුව | 100 |

සටහන : තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කල යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

06. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කල යුතුය.ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

07.අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ " කම්කරු/මුරකරු තනතුරු සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කර, 2026.04.20 දින හෝ ඊට ප්‍රථම " බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, **නො.150,බේස්ලයින් පාර,කොළඹ 09"**. යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ)

බන්ධනාගාර මූලස්ථානය,කොළඹ 09.
2026.03.12

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**